**ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව**
**මහ සභා රැස්වීම.**
**2022.07.19**

**සහභාගි වූ සභික නාමාවලිය :-**

01. ගරු සභාපති.ඩබ්.සුරන්ත ජයලත් වීරසිංහ මහතා
02. ගරු උප සභාපති මාතරආරච්චිගේ ජයවීර මහතා
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. සුනිල් ශාන්ත මහතා
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. සුජිත් ප්‍රේමලාල් මහතා
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.එච්.සුනිල් මහතා
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.කේ.බී.සමීර රුක්ෂාන් මහතා
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ කැළුම් වික්‍රමසිංහ මහතා
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.සරත් වික්‍රමසූරිය මහතා
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්. දසුන් මධුරංග වාසනා වික්‍රමගේ මහතා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඩබ්.එස්.එම්. අෂානි ප්‍රියංගිකා මහත්මිය
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රණී ඩී.එච්.සීතා පද්මණී මහත්මිය
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී රේණුකා ජීවානි අලහප්පෙරුම මහත්මිය
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ. සමන්ත රත්නායක මහතා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. අමිත් රණතුංග මහතා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස් චන්ද්‍රරත්න කුරුකුල මහතා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එම්.ඒ.ජී. අනෝමා රෝෂිණී නිලන්ති මෙනවිය
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඩබ්.එම්. ධම්මිකා නිලන්ති බණ්ඩාර මිය
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. මල්ක මදුභාෂන මහතා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එල්.ජී.රංජිත් මහතා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්රිණී එන්. ඒ. සාගරිකා පුෂ්ප කුමාරි මහත්මිය
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්. සුසන්ත කුමාරසිරි මහතා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. චන්ද්‍රසිරි මහතා
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.පී. පැතුම් මධුසංක මහතා
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එල්.ඒ.කාන්තිලතා මහත්මිය
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්. ජී. බ්‍රෙසිල් නුවන් කුමාර මහතා
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.නන්දසේන මහතා

**සහභාගි නොවූ සභික නාමාවලිය :-**

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් මේනුක දිසානායක මහතා

**සහභාගි වූ නිලධාරින් :-**

01.ලේකම් (වැ.බ) - එච්.එල්.ප්‍රේමදාස මයා.

02.සංවර්ධන නිලධාරී - ඩී.කේ.නිසංසලා මිය.

**<u>ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2022.07.19 දින පැවති මහ සභා රැස්වීමේ සංෂිප්ත වාර්තාවයි.</u>**

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2022 ජුනි මස මහ සභා රැස්වීම ආරම්භ කිරීම සඳහා 2022.07.19 වන දින පෙ.ව.10.00ට ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා අසුන් ගන්නා ලදි. ආගමික වතාවත් සිදු කිරීමෙන් හා ජාතික ගීය ගායනා කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් පිළිගැනීමේ කථාව පවත්වන ලදී. ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමාත් ගරු සභික මණ්ඩලයත්,ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයත්,ස්වේච්ඡා සංවිධාන නිලධාරීන් දෙපලත්, පිළිගැනීමෙන් අනතුරුව, න්‍යායපත්‍රානුකූලව සභාවේ කටයුතු ආරම්භ කරන ලදි.

### 01.පසුගිය මහ සභා වාරයේ සභා වාර්තාව සභා සම්මත කිරීම.

❖ 2022.06.17 වන දින පැවති මහ සභා වාරයේ සභා වාර්තාව සභා සම්මත කිරීම.

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
ගරු මන්ත්‍රීතුමනි, 2022.06.17 වෙනි දින පැවති මහ සභා වාරයේ සභා වාර්තාව සභා සම්මත කිරීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්ද්‍රරත්න කුරුකුල මහතා</u>
මෙම සභා වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කර සිටිනවා.

<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා</u>
එම යෝජනාව මා ස්ථිර කරනවා.

➢ **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2022 ජුනි මස 17 වැනි දින පැවති මහ සභා වාරයේ සභා වාර්තාවේ සංශෝධන නොතිබූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

### 02.ගරු සභාපතිතුමාගේ නිවේදන.

- පළාත් පාලන කොමසාරිස් විසින් යොමු කරන ලද CLG/AD/1/3/8 අංක දරණ 2022.06.30 දිනැති වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා ගැනීම පිළිබඳ ලිපිය.
- ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(1) උප වගන්ති ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.
- 2022 වර්ෂයේ 1 වන කාර්තුව සඳහා අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව සිදු කරන ලද අභ්‍යන්තර විගණන වාර්තාව.
- පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ ACLG 08/10 පොදු අංක දරණ 2022.06.12 දිනැති රාජ්‍ය වියදම් පාලනය කිරීම පිළිබඳ ලිපිය.
- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් මේනුක දිසානායක මහතා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි.

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් මේනුක දිසානායක මහතා අසනීප තත්ත්වයේ පසුවන බැවින් අද දින මහ සභා රැස්වීම සඳහා සහභාගිවීමට නොහැකි බව දන්වමින් ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා.ඔහුගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට මා යෝජනා කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බේසිල් නුවන් කුමාර මහතා</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**03.සංදේශ/පෙත්සම්/පැමිණිලි ඉදිරිපත් කිරිම.**

**නැත.**

**04.යථා පරිදි කල්දී ඇති ප්‍රශ්ණ.**

**නැත.**

**05.යථා පරිදි කල් දී ඇති යෝජනා.**

**05.01) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු 42 පදලංගල සතිපොල වාරික මුදල් නිසි පරිදි නොගෙවීම හේතුවෙන් 42 පදලංගල සතිපොල සම්බන්ධව තීරණයක් ලබා ගැනීමට හා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

2022 වර්ෂය සඳහා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු 42 පදලංගල සතිපොල ඒ.එල්.ඒ.මංජුල ප්‍රියදර්ශණ මහතා විසින් 460,261.00 ක වාර්ෂික බදු මුදලකට ලබා ගත්තා. මෙහි මාසික බදු වාරිකය රු:38,355.00ක් වෙනවා.නමුත් මෙම මාසික වාරික මුදල් මෙම සතිපොල බදු ගත් බදුකරු විසින් නිසි පරිදි ගෙවන්නේ නැහැ.ජනවාරි සිට මේ දක්වාම මෙම බදු මුදල් නිසි පරිදි ගෙවලා නැහැ.ඒ සම්බන්ධව විස්තර මෙහෙමයි.

| අනු අංකය | මාසය | හිඟ මුදල (රු:) | ප්‍රමාද ගාස්තු (රු:) |
|---|---|---|---|
| 01 | ජනවාරි | 10,268.00 | - |
| 02 | පෙබරවාරි | 38,355.00 | - |
| 03 | මාර්තු | 38,355.00 | 15,342.00 |
| 04 | අප්‍රේල් | 19,177.50 | 5,753.25 |
| 05 | මැයි | 19,177.50 | 3,835.50 |
| එකතුව | | **125,333.00** | **24,930.00** |

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ඒ අනුව සම්පූර්ණ හිඟ මුදල රු:150,263.00 (125,333.00 + 24,930.00)ක්.මෙම හිඟ මුදල හා ප්‍රමාද ගාස්තු ගෙවන ලෙස දිගින් දිගටම දැනුවත් කිරීම් කළත් එම මුදල් මේ දක්වා ගෙවීම් කිරීමට බදුකරු කටයුතු කරලා නැහැ.ඒ අනුව මෙම ප්‍රාදේශීය සභාව සතු 42 පදලංගල සතිපොල සම්බන්ධව තීරණයක් ලබා ගැනීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රේසිල් නුවන් කුමාර මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

මේ පිළිබඳ වැඩි දුරටත් සාකච්ඡා කිරීම සඳහා ගරු සභාපති සුරන්ත ජයලත් මහතාගේ හා ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදි.

මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව ගරු සභාපති සුරන්ත ජයලත් මහතාගේ හා ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත් කරන ලදි.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු 42 පදලංගල සතිපොලට අදාල 2022 ජනවාරි මස සිට මැයි මස දක්වා වූ රු:125,333.00ක මුදල ගෙවීම සඳහා බදුකරු හට 2022.07.20 වන දින සිට දින 7ක කාලයක්**

**ලබාදීමටත්,එසේ දින 07ක් ඇතුළත මෙම බදු මුදල ගෙවා දැමුවහොත් පමණක්, ඊට අදාල රු:24,930.00ක ප්‍රමාද ගාස්තු කපා හැරීමටත්,එසේ දින 07ක් ඇතුළත ගෙවීමට අපොහොසත් වුවහොත් ගිවිසුම් ප්‍රකාරව නීතිමය කටයුතු සිදු කිරීමටත්,සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.02) 2022 ජුනි මස 1,000,000.00 ට වැඩි වියදම් සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

2022 ජුනි මස මෙම සභාවේ ලක්ෂ 10ට වැඩි වියදම් 02ක් සිදු කරල තියෙනවා. එය විස්තර සහිතව පහතින් දක්වනවා. ඒ සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියලා මා යෝජනා කරනවා.

| අනු අංකය | දිනය | වවුචර් අංකය | චෙක්පත් අංකය | ආදායකයාගේ නම | ගෙවීම් විස්තරය | මුදල රු: |
|---|---|---|---|---|---|---|
| 01 | 2022.06.09 | 628 | 787977 | සී/ස මුල්ඇඩියාවල නැ/ගම නැගුම | මුල්ඇඩියාවල විහාරස්ථාන..... | 1,436,770.79 |
| 02 | 2022.06.22 | 666 | 787998 සිට 788014 දක්වා | වැටුප් | කාර්ය මණ්ඩල වැටුප් (ස්ථිර) | 3,439,785.05 |
| එකතුව | | | | | | **4,876,555.84** |

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්ද්‍රරත්න කුරුකුල මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2022 ජුනි මස රු:4,876,555.84 වූ ලක්ෂ 10ට වැඩි වියදම් සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06. හදිසි යෝජනා**

**06.01) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ වෙනුවෙන් ඇඹිලිපිටිය ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ඉන්ධන පිරවුම්හල මගින් ඉන්ධන ලබාගැනීම වෙනුවෙන්, ආවරණ අනුමැතිය යටතේ ලබාගත් රු:200,000.00ක අත්තිකාරම් මුදල සඳහාත්, එම අත්තිකාරම පියවීම සඳහාත්, අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ වෙනුවෙන් මෙතෙක් ඉන්ධන ලබා ගනු ලැබුවේ තුංකම පිහිටි ලංකා ඉන්ධන පිරවුම්හල මගින්.නමුත් දැනට රටේ පවතින ඉන්ධන හිඟය නිසා එම ඉන්ධන පිරවුම්හලෙන් ඉන්ධන ලබා ගැනීමට නොහැකියි.මේ නිසා අත්‍යාවශ්‍ය සේවා පවත්වා ගෙන යාමට ඉතා අසීරු තත්ත්වයක් තමයි උදාවෙලා තියෙන්නේ.මෙම සේවා පවත්වාගෙන යෑම සඳහා ඇඹිලිපිටිය ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ඉන්ධන පිරවුම්හල මගින් ඉන්ධන ලබා ගතහැකි බවට අපට තොරතුරු ලැබුණා.නමුත් ලංකා ගමනාගමන මණ්ඩලය ගණුදෙනු කරන්නේ අත්පිට මුදලට පමණයි.ඒ නිසා අපට එයින් ඉන්ධන ලබා ගැනීමට ආවරණ අනුමැතිය යටතේ රු:200,000.00 ක අත්තිකාරම් මුදලක් ලබා ගැනීමට සිදුවුණා.මෙම අත්තිකාරම් මුදල සඳහාත්,එම අත්තිකාරම පියවීම සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පැතුම් මධුශංඛ මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ වෙනුවෙන් ඇඹිලිපිටිය ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ඉන්ධන පිරවුම්හල මගින් ඉන්ධන ලබාගැනීම සඳහා, ආවරණ අනුමැතිය යටතේ ලබාගත් රු:200,000.00ක අත්තිකාරම් මුදල සඳහාත්, එම අත්තිකාරම පියවීම සඳහාත්, අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.02) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ වෙනුවෙන් ඉන්ධන හා ලිහිසි තෙල් ලබාගැනීම සඳහා රු:200,000.00ක අත්තිකාරම් මුදලක් ලබාගැනීම සඳහාත්, එම අත්තිකාරම පියවීම සඳහාත්, එම ඉන්ධන දිවයිනේ ඕනෑම ඉන්ධන පිරවුම්හලකින් හෝ ලිහිසි තෙල් අලෙවි සැලකින් ලබා ගැනීම සඳහාත් අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ වෙනුවෙන් ඉන්ධන හා ලිහිසි තෙල් ලබාගැනීම සඳහා රු:200,000.00ක අත්තිකාරම් මුදලක් ලබාගැනීම සඳහාත්, එම අත්තිකාරම පියවීම සඳහාත්, එම ඉන්ධන හා ලිහිසි තෙල් දිවයිනේ ඕනෑම ඉන්ධන පිරවුම්හලකින් ලබා ගැනීම සඳහාත්, අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතා</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ වෙනුවෙන් ඉන්ධන හා ලිහිසි තෙල් ලබාගැනීම සඳහා රු:200,000.00ක අත්තිකාරම් මුදලක් ලබාගැනීම සඳහාත්, එම අත්තිකාරම පියවීම සඳහාත්, එම ඉන්ධන දිවයිනේ පිහිටා ඇති ඕනෑම ඉන්ධන පිරවුම්හලකින් හෝ ලිහිසි තෙල් අලෙවි සැලකින් ලබා ගැනීම සඳහාත්, අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.03) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු LF 4834 අංක දරණ මහේන්ද්‍රා කැබ් රථයේ ස්ටාටර් මෝටරය හා ෆෑන් බෙල්ට් එක අළුතෙන් යෙදීම සඳහාත්,සයිලන්සරය හා එන්ජිම ආශ්‍රිත අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහාත් අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු LF 4834 අංක දරණ මහේන්ද්‍රා කැබ් රථයේ ස්ටාටර් මෝටරය හා ෆෑන් බෙල්ට් එක අළුතෙන් යෙදීම සඳහාත්,සයිලන්සරය හා එන්ජිම ආශ්‍රිත අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී සාගරිකා සුෂ්ප කුමාරි මහත්මිය</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු LF 4834 අංක දරණ මහේන්ද්‍රා කැබ් රථයේ ස්ටාටර් මෝටරය හා ෆෑන් බෙල්ට් එක අළුතෙන් යෙදීම සඳහාත්,සයිලන්සරය හා එන්ජිම ආශ්‍රිත අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.04) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු LK 9633 අංක දරණ ටිපර් රථයේ ප්‍රිමියන් රේසර් සෙට් එක,ඔයිල් සීල් සෙට් එක හා පැකින් සෙට් එක අළුතින් යෙදීම සඳහාත්,ඩිපරන්සර් අළුත්වැඩියා කිරීම සඳහාත්,හබ්ග්‍රීස් යෙදීම සඳහාත් අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු LK 9633 අංක දරණ ටිපර් රථයේ ප්‍රිමියන් රේසර් සෙට් එක,ඔයිල් සීල් සෙට් එක හා පැකින් සෙට් එක අළුතින් යෙදීම සඳහාත්,ඩිපරන්සර් අළුත්වැඩියා කිරීම සඳහාත්,හබ්ග්‍රීස් යෙදීම සඳහාත් අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී සාගරිකා සුෂ්ප කුමාරි මහත්මිය</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු LK 9633 අංක දරණ ටිපර් රථයේ ප්‍රිමියන් රේසර් සෙට් එක,ඔයිල් සීල් සෙට් එක හා පැකින් සෙට් එක අළුතින් යෙදීම සඳහාත්,ඩිපරන්සර් අළුත්වැඩියා කිරීම සඳහාත්,හබ්ග්‍රීස් යෙදීම සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.05) කදුරුගස්ආර ගල්මෝල මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම සඳහාත්,ඊට අදාලව සකස් කරන ලද ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

කදුරුගස්ආර ගල්මෝල මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම සඳහාත්,ඊට අදාලව සකස් කරන ලද රු:1,670,000.00ක ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වාසනා වික්‍රමගේ මහතා</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, කදුරුගස්ආර ගල්මෝල මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම සඳහාත්,ඊට අදාලව සකස් කරන ලද රු:1,670,000.00ක ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.06) වැව්සිරිගම මාර්ගයේ ආරම්භක කොටස කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම සඳහාත්,ඊට අදාලව සකස් කරන ලද ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

වැව්සිරිගම මාර්ගයේ ආරම්භක කොටස කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම සඳහාත්,ඊට අදාලව සකස් කරන ලද රු:567,000.00 ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, වැව්සිරිගම මාර්ගයේ ආරම්භක කොටස කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම සඳහාත්,ඊට අදාලව සකස් කරන ලද රු:567,000.00ක ඇස්තමේන්තුව සඳහාත්, අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.07) තුංකම, වැව්සිරිගම චාමර මහතාගේ නිවස මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම සඳහාත්,ඊට අදාලව සකස් කරන ලද ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

තුංකම, වැව්සිරිගම චාමර මහතාගේ නිවස මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම සඳහාත්,ඊට අදාලව සකස් කරන ලද රු:1,345,000.00ක ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, තුංකම, වැව්සිරිගම චාමර මහතාගේ නිවස මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම සඳහාත්,ඊට අදාලව සකස් කරන ලද රු:1,345,000.00ක ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.08) රංචමඩම තලාව මාර්ගයේ පැතිබැම්ම ඉදි කිරීම සඳහාත්,ඊට අදාලව සකස් කරන ලද ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

රංචමඩම තලාව මාර්ගයේ පැතිබැම්ම ඉදි කිරීම සඳහාත්,ඊට අදාලව සකස් කරන ලද රු:771,000.00ක ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, රංචමඩම තලාව මාර්ගයේ පැතිබැම්ම ඉදි කිරීම සඳහාත්,ඊට අදාලව සකස් කරන ලද රු:771,000.00ක ඇස්තමේන්තුව සඳහාත්, අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා විසින් සභාගත කරන ලද යෝජනාව</u>

**06.09) වසර 45කට ආසන්න කාලයක් තිස්සේ සේවා පහසුකම් ලබා දෙමින්, රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න මැතිවරණ කොට්ඨාශයේ,කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 217/ඒ කැම්පනේ ග්‍රාම නිලධාරී වසමේ ගොඩවෙල නුංගහයාය යන ස්ථානයේ පවත්වාගෙන ගිය නුංගහයාය උප තැපැල් කාර්යාලය වසා දැමීම හේතුවෙන් එම උප තැපැල් කාර්යාලය නැවත ගොඩවෙල නගරය ආසන්නයේ ස්ථාපනය කිරීම සඳහාත්,ඒ සඳහා අවශ්‍ය බලධාරීන් දැනුවත් කිරීම සඳහාත්, අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා.</u>

වසර 35කට ආසන්න කාලයක් සේවා පහසුකම් ලබාදුන් නුංගහයාය උප තැපැල් කාර්යාලය ගොඩවෙල නගරය ආසන්නයේ නැවත ස්ථාපනය කිරීම සඳහාත්,ඒ සඳහා අවශ්‍ය බලධාරීන් දැනුවත් කිරීම සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා</u>

ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා.</u>

ගරු සභාපතිතුමණි,රත්නපු දිස්ත්‍රික්කයේ කොලොන්න මැතිවරණ කොට්ඨාශයේ,කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 217/ඒ කැම්පනේ ග්‍රාම නිලධාරී වසමේ ගොඩවෙල නුංගහයාය යන ස්ථානයේ පවත්වාගෙන ගිය නුංගහයාය උප තැපැල් කාර්යාලය මේ වන විට වසා දමලා තියෙන්නේ. වසර 45කට ආසන්න කාලයක් පවත්වාගෙන ගිය නුංගහයාය උප තැපැල් කාර්යාලය මගින්,කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේත්, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේත් ගම්මාන 30ක් ආවරණය කරමින් සේවාවන් සපයනු ලැබුවා.එහි සේවය කළ උප තැපැල් ස්ථානාධිපතිවරිය පසුගිය දිනක විශ්‍රාම ගියා.වැඩ බලන උප තැපැල් ස්ථානාධිපති පනාමුර පැපොල්වතුයාය ප්‍රදේශයේ පදිංචි අයෙක්.ආදේශක උප තැපැල් ස්ථානාධිපති කෙනෙක් අනුමත කරල තියෙද්දීත් මෙම තැපැල් කාර්යාලය වසා දාලා එය ඕමල්පේ නගරයට අරගෙන ගියා.ගොඩවෙල නගරයේ සිට ඕමල්පේ නගරයට 5Km ක දුරක් යන්න ඕන.ගම්මානෙ ඇතුළෙ ඉඳලා ඕමල්පේ නගරයට 10Km යන්න ඕන.මේක බරපතල ප්‍රශ්නයක්.මේකෙ මහජන ආධාර ලබන අය 157ක්,වැඩිහිටි ආධාර ලබන අය 101ක්,ගොවි විශ්‍රාම වැටුප් ලබන අය 77ක්,පිළිකා ආධාර ලබන රෝගීන් 09ක් සහ තැලසීමියා

ආධාර ලබන එක් රෝගියෙක් වශයෙන් ඉන්නවා.මීට අමතරව තැපැල් ස්ථානයකින් සිදුවන සියළුම සේවාවන් මෙමගින් ඉටු කෙරුණා.රු:500ක ආධාරය ගන්න රු:2000.00ක මුදලක් වියදම් කරගෙන තමයි ත්‍රී රෝද රථයකින් යන්න වෙන්නේ.මොකද මේ පාරෙ බස් වැඩ කරන්නේ පැයකට එකක් වගේ.ඒවත් හැමදාම වැඩ කරන්නේ නැහැ.සෙනගත් වැඩියි.මේ නිසා සමහරු ආධාර ගන්න යන්නේ නැහැ.මේ කන්න බොන්නවත් නැති වෙලාවේ ඒකත් අතහැරලා දාන්න වෙනවා කියන්නේ මිනිස්සු තවත් අසරණ වෙනවා.ගම්වාසීන් මේකට විරුද්ධව පෙත්සම් පවා යොමු කළා.නමුත් ඒවට විසඳුමකුත් තවම ලැබිලා නැහැ.සියළුම බලධාරීන්ගේ අවධානය යොමු කරන්න මම මේක අපේ යෝජනාවක් විදියට යොමු කරනවා,මේ තැපැල් කාර්යාලය නැවත ගොඩවෙල නගරයේ ස්ථාපිත කරල දෙන්න කියලා.ගරු සභාපතිතුමණි,මෙය පවත්වාගෙන යන්න පැරණි ස්ථානය නැත්නම් අපි හදපු නිවසක් දෙන්න පුළුවන්.නැත්නම් අපේ සුසාන භූමියක හදපු ගොඩනැගිල්ලක් තියෙනවා.ඒක ගන්න පුළුවන්.අපේම ස්ථානයක් නොමිලේම දෙන්නත් පුළුවන්.නැත්නම් ගොඩවෙල නගරය ආසන්නයේ යම් ස්ථානයක් යම් සහන මුදලක් යටතේ අරගෙන දෙන්නත් පුළුවන්.කෙසේ හෝ මේ ගම්මාන තිහේ ජනතාවට මේ සේවාව ලබා දෙන්න කටයුතු කරමු කියන යෝජනාව මම කරනවා.මේක නොකෙරුණොත් මහපාරට බහින සංඛ්‍යාව විශාලයි, මේ සඳහා විරෝධතාවය දක්වන්න.අපි මේ දෙය කළොත් ආඩම්බරයෙන් කියන්න පුළුවන් අපි තමයි මෙය නැවත ස්ථාපිත කිරීමට කටයුතු කළේ කියලා.ඒ නිසා අපේ සියළු පක්ෂ එකතුවෙලා මේ සඳහා සහයෝගය දෙමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා</u>

ගරු සභාපතිතුමණි,ඉතාම හොඳ යෝජනාවක්.විශේෂයෙන්ම අපි දන්නවා තැපැල්,සෞඛ්‍ය වගේ දෙපාර්තමේන්තු ඇති කරන්නේම ජනතාවට විශාල සේවයක් සපයන්න.තැපැල් කාර්යාල වෙනස් කරද්දි කියන්නේම පාඩුයි කියලා.එතකොට තැපැල් ස්ථානාධිපතිවරුන්ගේ හෝ ඉහල නිලධාරීන්ගේ පෞද්ගලික මුදලින් නෙමෙයි තැපැල් කාර්යාල පවත්වාගෙන යන්නේ.ඒක දරන්නේ ඒ දෙපාර්තමේන්තුවෙන්.තැපැල් කාර්යාලයකින් අපට මතුපිටින් නොපෙනෙන විශාල සේවාවක් සිදු වෙනවා.තැපැල් ස්ථානයක් පවත්වාගෙන යන්න ස්ථාවයකට ගෙවන මුදල හරි අඩුයි.තැපැල් කාර්යාලයකින් සේවාව ලබා ගන්න එන්නේ තරුණ අය නෙමෙයි,වැඩිහිටියෝ.ලැබෙන ආධාර මුදල ත්‍රීවීල් එකකට දෙන්න වුණොත් එහෙම වැඩක් නැහැ.ඒ නිසා කඩිනමින් නැවත ස්ථාපනය කරලා දෙන්න කටයුතු කරන්න.මේව තැපැල් දෙපාර්තමේන්තුවෙන් විසඳන්න පුළුවන් ගැටළු.තව දුරටත් මෙය මහජන සේවයක් විදියට පවත්වාගෙන යන්න කඩිනමින් කටයුතු කරන්න.

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ගරු උප සභාපතිතුමා ගෙනාවේ ඉතා කාලෝචිත යෝජනාවක්.තැපැල් ස්ථානයක් කියන්නේ අහිංසක ජනතාවට සේවය සපයන ස්ථානයක්.ඒ නිසා අපි සභාවක් විදියට කඩිනමින් මෙයට මැදිහත් විය යුතුයි.මේ සඳහා අවශ්‍ය උපරිම දේ කරන්න මම කටයුතු කරනවා.

- **ඒ අනුව, වසර 45කට ආසන්න කාලයක් තිස්සේ සේවා පහසුකම් ලබා දෙමින්, රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න මැතිවරණ කොට්ඨාශයේ,කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 217/ඒ කැම්පනේ ග්‍රාම නිලධාරී වසමේ ගොඩවෙල නුගහයාය යන ස්ථානයේ පවත්වාගෙන ගිය නුගහයාය උප තැපැල් කාර්යාලය වසා දැමීම හේතුවෙන් එම උප තැපැල් කාර්යාලය නැවත ගොඩවෙල නගරය ආසන්නයේ ස්ථාපනය කිරීම සඳහාත්,ඒ සඳහා අවශ්‍ය බලධාරීන් දැනුවත් කිරීම සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

## 07.කාරක සභා වාර්තා සලකා බැලීම.

- **2022.07.11 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා.</u>

2022.07.11 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව අනුමැතිය සඳහා ඉදිරිපත් කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා</u>

2022.07.11 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව අනුමැතිය ලබාදීම සුදුසු බවට මා යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වාසනා වික්‍රමගේ මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව 2022.07.11 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාවේ සංශෝධන නොතිබූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**08.මාසික ආදායම් වියදම් වාර්තා සලකා බැලීම.**

I. **2022 ජූනි මස ලැබීම් සාරංශය.**
II. **2022 ජූනි මස ගෙවීම් සාරංශය.**
III. **2022.06.30 දිනට අදායම් එකතු කිරීමේ ප්‍රගති වාර්තා.**
IV. **2022 ජූනි මස ලක්ෂ 10ට වැඩි විදයම්.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා.</u>

2022 ජූනි මාසයට අදාළ ඉහත සඳහන් වාර්තා සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කර සිටිනවා.

<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා.</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, 2022 ජූනි මාසයට අදාළ ඉහත සඳහන් වාර්තා සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ හෙයින් ඒකමතිකව සහා සම්මත විය.**

**09.වෙනත් කරුණු**

නැත.

- **ගරු සභාපති තුමාගේ ස්තුති කථාව.**

අද දින මහ සභාවේ කටයුතු සාර්ථක කර ගැනීමට සහාය ලබා දුන් සියලුම ගරු මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයටත් මාගේ ගෞරව පූර්වක ස්තුතිය පුදකර සිටිනවා.

2022.07.19 වන දින පැවති මහ සභාව මධ්‍යාහ්න 12.00ට පමණ නිමාවට පත් විය.

සුරන්ත වීරසිංහ,
සභාපති,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව,
තුංකම.